විධාන අංක 41.

2003 අංක 9 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත

12(1) වැනි වගන්තිය යටතේ විධානය

2003 අංක 9 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 12(1) වගන්තිය යටතේ ක්‍රියාකරමින් දේශීයව නිෂ්පාදනය කරනු ලබන පෙට්ටිවල අසුරණ ලද ආරක්ෂිත ගිණිකූරු, කිසිම නිෂ්පාදකයෙකු, බෙදාහරින්නෙකු හෝ වෙළෙන්දෙකු විසින් තොග වශයෙන් හෝ සිල්ලර වශයෙන් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් නිකුත් කරනු ලබන පහත සඳහන් SLS භාණ්ඩ සහතික ලාංඡනය දරන්නේ නම් මිස එකී පෙට්ටිවල අසුරණ ලද ආරක්ෂිත ගිණිකූරු නිෂ්පාදනය කිරීම, බෙදාහැරීම, ප්‍රවාහනය කිරීම, ගබඩා කිරීම, විකිණීම හෝ විකිණීම සඳහා ඉදිරිපත් කිරීම හෝ විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම නොකළ යුතු බවට මෙයින් විධාන කරනු ලැබේ.

පෙට්ටිවල අසුරණ ලද ආරක්ෂිත ගිණිකූරු - SLS 11

මෙම විධානය වර්ෂ 2012 ජුනි මස 01 වැනි දින සිට බලපැවැත්වෙනු ඇත.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අණ පරිදි,

රූමි මර්සූක්,
සභාපති.

2012 ජනවාරි මස 25 වැනි දින,
කොළඹ දී ය.

02 - 391/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.